# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2331/52 – 2023 මැයි මස 12 වැනි සිකුරාදා – 2023.05.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2017/09.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.05.27 දිනැති හා අංක 2125/3 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.05.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් වස්කඩුව, කුඩා වස්කඩුව, ගාලු පාර, "හේමන්ත" හි පදිංචි ජී. දයා හේමන්ත සිල්වා මයා සහ කොළඹ 05, ජාවත්ත පාර, අංක 93 හි පිහිටි සීමාසහිත ලංකා සළුසල අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.01.04 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අප්‍රේල් මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 039468 – 18 (2023/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය

ජී. දයා හේමන්ත සිල්වා මයා,
"හේමන්ත",
ගාලු පාර,
කුඩාවස්කඩුව,
වස්කඩුව.

*(පළමු පාර්ශ්වය)*

යොමු අංකය: IR/COM/04/2017/09.
නඩු අංකය: A/54/2019.

*එදිරිව*

සීමා සහිත ලංකා සළුසල,
අංක. 93,
ජාවත්ත පාර,
කොළඹ - 05.

*(දෙවන පාර්ශ්වය)*

අතර පවතින කාර්මික ආරාවුල

**පෙනී සිටීම :-**

| | | |
|---|---|---|
| පළමු පාර්ශ්වය වෙනුවෙන් | - | නියෝජිත එච්. ඒ. පියදාස මයා |
| දෙවන පාර්ශ්වය වෙනුවෙන් | - | නීතිඥ තිවංක කරුණාරත්න මයා<br>සහකාර සාමාන්‍යාධිකාරී<br>එස්. ඒ. එස්. තෙවරප්පෙරුම මයා |

ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සබඳතා ගරු අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින්ම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන ) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2019.05.23 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත කී යොමු කිරීමට අනුව ඉහත පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී ඇති කරුණ වනුයේ "සීමාසහිත ලංකා සළුසල ආයතනයේ ජ්‍යෙෂ්ඨ පරිපාලන කළමනාකරු ලෙස සේවය කළ ජී. දයා හේමන්ත සිල්වා මහතා ස්වෙච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ වන්දි ක්‍රමය යටතේ විශ්‍රාම ගැන්වීමේ දී ඔහුට ගෙවූ වන්දි හා පාරිතෝෂික මුදලින් රුපියල් දෙලක්ෂ දහනවදහස් එකසිය තිස්හතයි ශත අනූව (රු. 219,137.90) ක මුදලක් අඩුකර ගැනීම යුක්ති සහගත ද එසේ නොවේ නම් ඔහුට හිමි විය යුතු සහනය කුමක්ද යන්න පිළිබඳව වේ." එසේ නොවේ නම් ඔහුට හිමි විය යුතු සහනය කුමක් ද යන්න වේ.

පළමු වන පාර්ශ්වය ප්‍රකාශය ඉදිරිපත් කරන ලද්දේ 2019.10.29, 2019.11.13, 2019.11.26,2020.01.16 සහ 2020.02.20 වැනි දිනවලට නඩුව කැඳවූ අවස්ථාවේ දී වගඋත්තරකාර පාර්ශ්වයෙන් නිසි නියෝජනයක් නොවුනි. නමුත් 2020.02.20 දින සළුසල ගණකාධිකාරිවරයා ඉල්ලුම්කරුට විරුද්ධව ලිඛිත කරුණු ඉදිරිපත් කරන ලදී. එහෙත් ඉන් පසු 2020.07.27 දින දෙවන පාර්ශ්වය වන සළුසල නොපැමිණි බැවින් 2020.08.27 වැනි දින නඩුව අවසාන ලෙස සුදුස්සක් කිරීම සඳහා කැඳවුවත් එදින ද සළුසල නියෝජනයක් නොවූ බැවින් දෙවන පාර්ශ්වයේ විරෝධතා ඉදිරිපත් කළ ගණකාධිකාරි හා පිරිස් කළමණාකරුගේ පුද්ගලික නමට සහ සළුසල සභාපතිගේ පුද්ගලික නමට ලියාපදිංචි තැපෑලෙන් අවසාන දින කාර්ය සටහන් යැවීම සඳහා නියෝග කර 2020.09.15 දිනට නඩුව කල් තබන ලදී. නමුත් රටේ එවකට පැවති තත්ත්වයන් හා වග උත්තරකාර පාර්ශ්වය තම දෙවන දේශන සඳහා දින ඉල්ලා 2020.11.23 දින එම විරෝධතා ඉදිරිපත් කළ පසු 2020.11.27 වැනි දින ඉල්ලුම්කරුගේ නීතිඥවරයා විසින් ප්‍රතිවිරෝධතා ඉදිරිපත් කරන ලදී.

2021.02.08 දින ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ මොහාන් වල්පිට මහතා දීර්ඝ විස්තරයක් කරමින් ඒක පාර්ශ්විය විභාගයකට ඉල්ලුම් කරත් වගඋත්තරකාර පාර්ශ්වයේ නීතිඥ ඩී. කලංසූරිය මහතා නඩුව පවත්වා ගෙන යාමට ඉල්ලා සිටින ලදී. ඒ අනුව ඉල්ලුම් කරුගෙ සාක්ෂි ආරම්භ කරන ලදී. ඉල්ලුම්කරු ඒ 2 (වගඋත්තරකරුගේ වයි - 2) ලෙස ලකුණු කළ සභාපතිට ඉදිරිපත් කළ 2011.01.05 ලිපිය මගින් කරුණු දක්වමින් විශේෂ දීමනාවක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. එහි සඳහන් වන්නේ යම් මුදලක් ලබා දෙන ලෙසයි. ඉල්ලුම්කරුගේ සාක්ෂියේ දී " අමතර රාජකාරි සලකා බලා ගමන් දීමනාව විශේෂ දීමනාවක් වශයෙන් සලකා, වැන් රථයෙන් ගෙදර යාමට හා ඒමට පමණක් අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලස්වන්න " යනුවෙන්ය. මෙම ඉල්ලුම්කරු මෙම ඉල්ලීම කර ඇත්තේ තම උසස් නිලධාරියා වන සභාපතිවරයා ගෙන්ය. ඔහු තම නියෝගය සාමාන්‍යාධිකාරිවරයාට දුන් විට එම නියෝගය වැරදි යැයි නිවැරදි නීතිමය තත්ත්වය (සභාපතිවරයාට) පෙන්වා දීම ඉහළම විධායක පරිපාලන නිලධාරිගේ රාජකාරි යුතුකම හා වගකීම වෙයි. එසේ නොකර ඉල්ලුම්කරු විශ්‍රාම යන විට ඔහුගෙන් එම වැටුප එම දීමනා අයකර ගැනීම සාධාරණ නොවේ. ඉල්ලුම්කරු ප්‍රවාහන පහසුකම් ඉල්ලා ඇත්තේ 2013.05.02 දින දීය. 2011.01.05 ඉල්ලුම්කරුගේ ලිපිය අධ්‍යනය කළ විට පෙනී යන්නේ හා ඔහු සභාපතිවරයාට දන්වා සිටින්නේ තම ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා බවත් සති අන්ත විවිධ උත්සව (අවුරුදු, නත්තල්) සමයෙහි සති අන්තය දිවා රාත්‍රී කාලය තුළ විවිධ මට්ටමේ සේවයන්හි නිරතවන නිසාත්, අතිකාල දීමනා ජ්‍යෙෂ්ඨ කළමණාකරු ලෙස නොලැබෙන නිසාත් සභාපති හා සමාන්‍යාධිකාරි නියෝජනය කරමින් විවිධ රාජ්‍ය උත්සව වැඩ මුළු නියෝජනය කරන බැවිනුත්, එම විශේෂ රාජකාරි සේවය සඳහා " විශේෂ දිමනාවක් ලෙස යම් මුදලක් ලබා දෙන ලෙසය" මෙම නියෝගය නව සභාපතිවරයෙකු පත් වූ පසු එම සමාන්‍යාධිකාරිවරයාම එම දීමනාව සහ ප්‍රවාහන පහසුකම නැවැත්වීමට නියෝග කර චක්‍රලේඛන පෙන්වා සිටීම විහිළු සහගත කරුණකි.

2010.04.30 දිනැති ලිපියෙන් ප්‍රධාන විධායක නිලධාරිගේ ඉල්ලීම මත ( ඒ - 3 ) කළමණාකරුවන් සහ සහකාර කළමණාකරුවන් හෝ කළමණාකරුවන්ගේ සේවය ආවරණය කරන්නන්ට රු.5000.00 දීමනාවක් ලබා දෙන ලෙස සමාන්‍යාධිකාරිවරයා වෙත ඉල්ලා ඇත.

2013.05.02 දින ඉල්ලුම්කරුගේ ලිපියෙන් (ඒ - 4 සාක්ෂි ලේඛනය) ඉල්ලුම්කරුට ගමන් පහසුකම් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. 2013.05.06 දිනැති විජය අල්විස් සමාන්‍යාධිකාරිවරයා විසින් නිවසේ සිට සේවයට පැමිණීමට හා ආපසු යාමට වාහන පහසුකම් ලබා දෙන ලෙස (ඒ - 5) වැඩ බලන කළමණාකරු (ප්‍රවාහන ) වෙත නියෝගයක් කර අත. විත්තිකාර ආයතනයේ ඇමුණුමක් ලෙස ද මෙම 2013,05,02 ලේඛනය ඉදිරිපත් කර ඇත. එම ලිපිය එම ආයතනයේ ලිපිගොනුවල නැති බැවින් ඉල්ලුම්කරුගේ ලේඛන ගොනුවෙන් ලබා ගෙන ඇති බව පෙනේ. මෙම ගමන් පහසුකම් සලසා ඇති වාහනයේ වෙනත් නිලධාරින් ද ගමන් කළ සමූහ ප්‍රවාහන පහසුකම් දෙන ලද (Routine) සේවාව නාමලී බෝතේජු වැනි සාක්ෂිකරුවන්ගේ සාක්ෂි වලින් ද තහවුරු වේ. මෙම ඉල්ලුම්කාර දයා හේමන්ත සිල්වා ස්වෙච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ දී වන්දි ක්‍රමය යටතේ විශ්‍රාම ගැන්වීමේ දී ඔහුට වන්දියෙන් හා පාරිතෝෂික මුදලින් රුපියල් දෙලක්ෂ දහනව දහස් එකසිය තිස් හතයි ශත අනූව (රු.219,137.90 ) මුදල අඩු කර ගැනීම යුක්ති සහගත ද යන්න විසඳීමට යාමේ දී ප්‍රධාන ගොනුවේ ඇති 368 දක්වා ලේඛන ද විත්ති පක්ෂයේ ගොනු කළ ලිඛිත දේශනවල 369 සිට 452 දක්වා ලේඛන ද ඉල්ලුම්කාර පාර්ශ්වයේ දේශනවල 453 සිට 607 දක්වා ලේඛන මීට අයත් විවිධ පරීක්ෂණ මණ්ඩල කොමිසන් වාර්තා සහ ප්‍රධාන ලෙස සාක්ෂි සටහන් කියවා තීරණ ගැනීමට ඉතා දිගු කාලයක් වැය කිරීමට සිදු විය. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ මුදල් අධ්‍යන අංශය (සළුසල) නිකුත් කළ චක්‍රලේඛන ව්‍යවස්ථාවන් ද ඇත. තීරණ ගන්නවාට වඩා මෙම ඉල්ලුම්කරුට සේවය අවසන් කර විශ්‍රාම ගැන්වීමේ දින දක්වා නිලධාරීන් (ඉහළ සිට පහළට) සිතා මතා නැතත් තමන්ගේ වගකීම් නිසි ආකාරව අධ්‍යයන කර තින්දු තීරණ ගන්නේ නම් මෙම ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදු නොවී ආරම්භයේ දීම ඔහුට තම කාලය, ශ්‍රමය ප්‍රමාණය ඉක්මවා වැය නොකර රාජකාරි ප්‍රමාණයට කටයුතු කිරීමට තිබුණි. ඒ බව සනාථ කිරීමට මෙම ලේඛන අධ්‍යයන හා පරිශීලනය කිරීමෙන් කිව හැකිව ඇත. උදාහරණ දෙමින් මෙම තීරණය ලේඛන ගත කරන්නේ නම් පිටු ගණනක් ලිවීමට සිදු වන බැවින් විසඳිය යුතු පැනය පමණක් පෙන්වා දෙමින් මාගේ විසඳුම ලබා දෙන්නෙමි. කිව යුතු විශේෂ කරුණ වන්නේ මෙම ආයතනයේ ගොනුවල ලේඛන තබා ගත්තේ නැත කියා එක් සාක්ෂිකරුවෙකු දිවුරුම් දී සාක්ෂි දීමේ දී කියා ඇතත් මෙම නඩුවේ විරෝධතා ගොනු කළ නීතිඥවරිය අදාළ ලේඛන සහතික පිටපත් ලෙස ගොනු ගත කර ඇත. සමහර ලේඛන පුද්ගලික ලිපි ගොනුවේ ඉදිරිපත් කළ හැකි බව කීවත් ඉදිරිපත් නොකිරීම තීරණ ගැනීමට අපහසුතාවයට පත් කරන කරුණක් විය.

එක් සභාපතිවරයෙකු දෙන ලද තීරණය මීළඟට පැමිණෙන සභාපති අවලංගු කිරීමත් ඉල්ලුම්කරු විශ්‍රාම ගන්නා විට කරන ලද පරීක්ෂණයේ දී තර්ජනය කර ලිපි ලබා ගැනීම ( නාරාහේන්පිට පොලිසියට කළ පැමිණිල්ල සහ එම පරීක්ෂණ ) යන කරුණු අනුවත් නිලධාරින්ගේ වගකීමක් නැති තීන්දු තීරණ පහළ සේවකයින්ට කාලයෙන් කාලයට අසාධාරණකම් සිදු වන බව ඉදිරිපත් කළ සාක්ෂි ලේඛන අනුව පෙනී යයි. ඉහත සඳහන් කළ කරුණු වාර්තා සාක්ෂි හා ලේඛන මත සකස් කරන ලද තීරණයක් වන බව පවසමින් 2016.10.10 වැනි දින (විශ්‍රාම ගැන්වීමට දින කිහිපයකට පෙර) 1987.08.17 දින සිට 2016.07.31 දක්වා වූ සේවා සහතිකයට ද අවධානය එ ( ඒ - 1) ලේඛනයට යොමු කිරීමේ දී ඉල්ලුම්කරුට ලැබීමට නියමිත වන්දි හා පාරිතෝෂික මුදලින් රු.219,137.90 (රුපියල් දෙලක්ෂ දහනව දහස් එකසිය තිස් හතයි ශත අනූව) ක මුදලක් අඩු කර ගැනීම යුක්ති සහගත නොවන බව තීරණය කළ හැකිය. ඒ නිසා ඔහුට එම මුදල සළුසල ආයතනය විසින් මෙම ප්‍රදානය ගැසට් ගත කිරීමෙන් සති 02 ක කාලයක් තුළ සහකාර කම්කරු කොමසාරිස් (නැගෙනහිර කොළඹ) වෙත තැන්පත් කිරීමට නියම කරමි. මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

ආර්. එස්. ආරියප්පෙරුම,
බේරුම්කරු,

2023, ජනවාරි මස 04. වැනි දින

EOG 05-0079

මගේ අංකය: IR/COM/05/2018/285.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.08.05 දිනැති හා අංක 2135/15 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.07.24 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පාදුක්ක, බෝපේ, මාහිංගල, අංක 60 හි පදිංචි එම්. සුරත් සාරංග මයා සහ පාදුක්ක, වටරැක, පින්නලන්ද වත්ත, හයිලෙවල් පාර, 32 කණුව හි පිහිටි මදර්සන් ඉලෙක්ට්‍රිකල් වයර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.01.04 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අප්‍රේල් මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

එම්.සුරත් සාරංග මයා,
අංක 60,
මාහිංගල,
බෝපේ,
පාදුක්ක.

*(පළමු පාර්ශ්වය)*

නඩු අංකය: A/81/2019.
IR/COM/05/2018/285.

*එදිරිව*

මදර්සන් ඉලෙක්ට්‍රිකල් වයර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්,
32 කණුව, හයිලෙවල් පාර,
පින්නලන්ද වත්ත,
වටරැක, පාදුක්ක.

*(දෙවන පාර්ශ්වය)*

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින්, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන ) පනත සමග කියවා ) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය ( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය ) වන කාර්මික ආරාවුල් පනතේ 4 ( 1 ) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2019.07.24 වැනි දින බේරුම්කරු වශයෙන් ආර්. එස්. ආරියප්පෙරුම වන මා පත් කොට මා වෙත යොමු කර ඇත.

එකී යොමු කිරීමට පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී ඇති කරුණු වනුයේ,

" මදර්සන් ඉලෙක්ට්‍රිකල් වයර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවය කළ එම්.සුරත් සාරංග මහතාට 2012 වර්ෂයේ උසස්වීමක් ලබාදීමත් සමග එතෙක් ගෙවන ලද වැටුප අඩු කර ගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමි සහනයන් මොනවාද? යන්න පිළිබඳව වේ."

පළමු පාර්ශ්වය සහ දෙවන පාර්ශ්වය අතර පළමු සහ දෙවන ප්‍රකාශයන් ගොනු කරන ලද අතර සමථයක් නොමැති බව ප්‍රකාශ කර සිටි බැවින් 2021 මාර්තු 13 වැනි දින වගඋත්තරකාර පාර්ශ්වයටද යවමින් ඉදිරිපත් කළ දිවුරුම් ප්‍රකාශය අනුව 2021.03.19 වැනි දින ඉල්ලුම්කරු වෙනුවෙන් ශ්‍රේෂන් සිල්වා මහතා පෙනී සිටිමින් සහ වගඋත්තරකාර සමාගමේ ප්‍රධාන විධායක සුමිත් සචාල් මහතා සමඟ මානව සම්පත් කළමණාකාරිණී එම්.ජී.කාංචනා මහත්මිය පෙනී සිටිමින් ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂි කැඳවන ලදි.

2003.10.11 වන දින සහායක යන්ත්‍ර ක්‍රියාකරුවෙකු ලෙස සේවයට බැඳුනු ඉල්ලුම්කරු 2012.03.05 වන දින තත්ත්වපාලක සුපරීක්ෂක තනතුරට උසස් කර ඇත. ඉල්ලුම්කරු 2021.03.13 දිනැති දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කර 2021.03.19 වැනි දින වාචික සාක්ෂි ද ඉදිරිපත් කරන ලදි. දෙවන පාර්ශ්වය අවස්ථා ගණනාවකදී වාචිකව තමාට දන්වා සිටින ලද්දේ මසකට 8300 ක වැටුප් වැඩි වීමක් සහිතව උසස්වීමක් ලබා දෙන බවයි. එහෙත් 2012 මාර්තු මස වැටුප් ලැබූ පසු "අහසින් හෙන පාත් වෙන්නාක් මෙන් මා අන්ද මන්ද වූ බව" ප්‍රකාශ කරන ලදි. එයට හේතුව 2012 පෙබරවාරි වැටුපට වඩා අඩු වැටුපක් මාර්තු මස ලැබුන බවයි. ඒ සඳහා A2, A3 දරන වැටුප් ලේඛන ඉදිරිපත් කර ඇත. ඒ අනුව මූලික වැටුප අඩු වීමත් සමඟ අතිකාල ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා ද බලපෑ බවත් මාසික අදායම ¼ ප්‍රමාණයකින් පහත වැටුනු බව ප්‍රකාශ කරන ලදි. දරුපවුලක් ජීවත් කරන තමා දැඩි දුෂ්කරතාවයකට පත් වූ බවද ප්‍රකාශ කරන ලදි. මෙම කරුණු වගඋත්තරකරුගේ 2019.11.15 දින විරෝධතා ප්‍රකාශයේ "X4" මඟින්ද තහවුරු වෙයි. 2021.03.13 පැමිණිලිකරුගේ දිවුරුම් පෙත්සමේ 12 වන ඡේදය මඟින් "මා වෙත A1 නිකුත් කිරීමෙන් මෙහි වගඋත්තරකරු හිතාමතාම මා නොමග යවා ඇති බවත්, ඒ අනුව මා අවස්ථා කීපයකදී මා හට සිදු කර ඇති අසාධාරණය සම්බන්ධයෙන් වගඋත්තරකරුට කරුණු ඉදිරිපත් කලත්, ඒ අයගේ උපදෙස් වූයේ මෙය "අපේ සිස්ටම් එකක්, ඕනේනම් ඉන්න නැතිනම් යන්න" කියායි. ඒ වන විට මාගේ බිරිඳ දරු ප්‍රසූතියකට අසන්නව සිටි නිසා ඉතාම අපහසුතා මත රැකියාවේ යෙදී සිටියේ ඒ වන විට රැකියාවක් සොයා ගැනීමේ අපහසුතාවය නිසා බවද" සැලකර සිටින ලදි.

මූලික වැටුප අඩු කිරීමත් 2013 සිට 2017 වර්ෂය සඳහා වාර්ෂිකව ගෙවූ වැටුප් වර්ධක ප්‍රමාණයද අඩු වූ බවත් අතට ලැබෙන වැටුපෙන් ජීවත් වීම අපහසු බැවින් සේවයෙන් ඉවත්වීමට සිදුවූ බව කියා සිටින ලදි. උදාහරණ :- පෙබරවාරි 12 මූලික වැටුප 12905/= , මාර්තු 12 මූලික වැටුප 9765 බවයි. 2012 වසරේ වැටුප් වර්ධක ලබා දෙන A1 ලිපිය නිකුත් කර වගඋත්තරකරු හිතාමතා තමා නොමග යවන ලද බවත් අවස්ථා කිහිපයකදී ඔහුට සිදු වී ඇති අසාධාරණය කියා සිටියත් වගඋත්තරකරු දෙන ලද පිළිතුර වූයේ " අපේ සිස්ටම් එකක්, ඕන්නම් ඉන්න නැත්නම් යන්න" බවයි. ඒ වන විට බිරිඳට දරුවෙකු ලැබීමට සිටි නිසාත් රැකියාවක් සොයාගැනීමට අපහසු නිසා රැකියාවේ රැඳී සිටි බව කියා ඇත. එසේම උසස්වීම් දෙන බැව් සඳහන් ලිපියේ අදාල වැටුප් පරිමාණය කුමක්ද සහ වරප්‍රසාද මොනවාද යන්න පිළිබඳ කිසිඳු සඳහනක් නොවූ බවයි.

වග උත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි මානව සම්පත් කළමණාකාරිණී එම්.ජී.කාංචනා මහත්මිය ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂියෙන් පසු හරස් ප්‍රශ්න අසමින් " වැටුප වැඩිවීම සමඟ රුපියල් 5000/= ක වැටුප් වැඩිවුනා" දැයි ඇසූ විට, "මගේ වැටුප වැඩි වුනේ නැහැ, මූලික වැටුප් අඩු කරලා එක් දීමනාවක් වශයෙන් මට දුන්නා එය වැටුප් වැඩිවීමක් ලෙස මම පිළිගන්නේ නැහැ". "වැටුප් වැඩිවූ අවස්ථාවේ මානව සම්පත් කළමණාකරු හෝ ඊට ඉහළ නිළධාරියෙකු හමුවුණා දැයි" ඇසූ විට "හමුවුනා එයාට කරන්න දෙයක් නැති බව ප්‍රකාශ කලා" යැයි උත්තර දෙන ලදි. ඉන්පසු ඊට ඉහළ නිළධාරින් සමඟ කතා කලා දැයි අසන ලද ප්‍රශ්නයට දුන් පිළිතුර වූයේ "අවස්ථා ගණනාවකදී කතා කළ බවත් ඒ හැම අවස්ථාවේම ඊළඟ එකෙන් කියන එක තමයි පිළිතුරට ලැබුනේ." විටින් විට මේ පිළිබඳ තමාට සාධාරණයක් නොවුනානම් අවුරුදු පහ තුළ ලිඛිතව කරුණු ඉදිරිපත් කළේ නැත්තේ මන්දැයි ඇසූවිට "ආයතන ප්‍රධානියාට සහ මානව සම්පත් කළමණාකරු සමග සාකච්ජා කළා, මගේ ප්‍රශ්නය දැනුම් දෙන්න ඕනේ අයට වාචිකව කතා කලා, ලිඛිතව ලබා දුන්නත් ඒ වෙලාවේ දෙන්න තිබෙන පිළිතුරත් ඒකමනෙ ඒ නිසා මම ලිඛිතව ඉල්ලීම් කළේ නැහැ" යැයි පිළිතුරු දෙන ලදි. ආයතනයේ ප්‍රධානීන් වර්ෂ 3½ කට වරක් මාරුවන නිසා නැවත අලුත් ප්‍රධානි පැමිණීමට ලිඛිතව දැනුම් නොදුන්නේ ඇයි දැයි කියා ඇසූවිට, "එය මා කළ වරදක් නොවේ ආයතනය රුපියල් 14000/= කට වගේ තිබූ මූලික වැටුප රුපියල් 9000/=ට අඩු කළා ලොකු අඩු වීමක් කර උසස් වීම් ලිපියක් දුන්නා. එය ආයතනය තුළ තිබෙනවා. ඉතින් මම හිතනවා එය නැවත ලිඛිතව දීම සාධාරණ නැහැ, ඒ නිසා මම හැම තිස්සේම ඒ ගැන ආයතන ප්‍රධානින් සමඟ කතා කළා" යැයි පිළිතුරු දී ඇත.

2012 මාර්තු මසට පසු භුක්තිවිඳි වරප්‍රසාද මොනවාදැයි ඇසූ විට වරප්‍රසාද කියා දෙයක් ලැබුනේ නැහැයි ද "යතුරු පැදිය මට විතරක් මගේ උසස්වීමට ලැබූ දෙයක් නොවන බව" ප්‍රකාශ කරන ලදි. ආයතනයේ සියලු දෙනාට ගමන් පහසුකම් සපයන බව මූලික ප්‍රකාශයන් සහ සාක්ෂි මගින් තහවුරු වෙයි. 2022.05.25 වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂියෙන්ද පිළිගෙන ඇත. වසර පහකට පසු තමාට සිදුවූ අසාධාරණය සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කරන්න තමාට විශේෂ හේතුවක් තිබුනාදැයි ඇසූ විට "අවුරුදු පහක් තුළ ආයතනයට මේ ගැටලුවට පිළිතුරක් දෙන්න බැරිනම් මම එම ආයතනයේ රැඳී සිටිනවා දැයි මම තීරණය කරන්න ඕන. හැමෝම කටවචනය විතරයි කියන්නේ. ඊළඟ අවුරුද්දේ ඔයාට දෙගුණයක් ගෙවන්නම්, ඊළඟ අවුරුද්දේ තුන්ගුණයක්

ගෙවන්නම්, ආයතනයේ වැඩටික කරන්න ඕනේ නිසා පැය 14, පැය 32 වගේ වැඩ කරලා තියනවා. අපේ ප්‍රශ්නයට නිවැරදි පිළිතුරක් ලබා දෙන්න බැරිනම් තවත් ඒ ආයතනයේ රැඳිලා ඉන්න එකේ ඵලක් නැහැයි" යන්න සාක්ෂි දෙන ලදි. නැවත ප්‍රශ්න කිරීමේදී අඩු වැටුපකට හෝ එම තත්ත්වය අවුරුදු 5ක් විඳදරා සිටියේ මාස තුනක දරුවෙක් සිටීමත්, එවැනි කර්මාන්තශාලා නැතිකම නිසා නව රැකියාවකට යාමට හැකියාවක් නොතිබූ නිසා බවයි. ඉල්ලුම්කරුගේ ලිඛිත සැලකිරීම් වලදී එක් අවස්ථාවක සඳහන් කර තිබුනේ (2020.07.10) '' සමාගම පවසන ආකාරයේ යහපත් සේවා පරිසරයක් නම් මා හට නොලැබුන අතර සහෝදර සේවක මණ්ඩලයේ උසුලු විසුලු නම් නොඅඩුව මා හට ලැබුනි. මන්ද මා කාර්යාල සේවයට ගොස් සමකාලීන සහෝදරවරුන්ගේ වැටුපටත් අඩු වැටුපක් ලැබීම හේතුව" නිසා බවයි.

මෙම වගඋත්තරකාර ආයතනයෙන් ඉදිරිපත් කරන ලද ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති ලේඛන පිළිගැනීමේ අපහසුතා පවතින්නේ එම ඉදිරිපත් කළ වැටුප් ලේඛනවල වර්ෂය සඳහන් නොමැති වීමයි. 2019.11.15 දින විරෝධතා ප්‍රකාශය සමඟ ඉදිරිපත් කර ඇති ලේඛනවල "X4" මඟින් වැටුප් අඩුවීම තහවුරු වෙයි. එසේම එකී විරෝධතා ප්‍රකාශයේ "උ", "ස" ඡේද මඟින් වැටුප් වැඩිවීමක් නොවූ බව සහ මූලික වැටුපට සාපේක්ෂව අර්ථසාධක අරමුදල, අතිකාල දීමනා ගණනය කිරීම සිදුවන බැවින් නව වේතන සැලැස්මක් සමඟ එකී අරමුදල් වලට බැරවන මුදල සහ අතිකාල දීමනා සුළු වශයෙන් වෙනස් වීමකට ලක්වී ඇති බව පිළිගෙන ඇත.

ඉල්ලුම්කරුට සේවය අතහැර යාමට සලස්වා ඇති බව ඉදිරිපත් කර ඇති ප්‍රකාශයන්, සාක්ෂි, සාක්ෂි ලේඛන මඟින් තහවුරු වෙයි. උසස් වීමක් දීමේදී වැටුප් සහ දීමනා එම ප්‍රමාණයෙන් හෝ ඊට වැඩිපුර ප්‍රමාණයකින් ගණනය නොකර යම් අවස්ථාවක දී තිබූ ප්‍රමාණයට වඩා අඩුවෙන් වැටුප ගණනය කළ ලිපියක් භාරගැනීමට ප්‍රතික්ෂේප කළ විට පවසා ඇත්තේ කැමැත්තෙන් ඉල්ලා අස්වූ බවට ලිපියක් ලබාදෙන ලෙසය. උසස්වීමකදී වැටුප එම ප්‍රමාණයට හෝ ඊට වැඩි විය යුතු අතර දීමනා සහ පහසුකම් වැඩි කිරීම ඊට අතිරේක දෙයක් වෙයි. එසේම තවත් අවස්ථාවක "ඕන්නම් ඉන්න නැත්නම් යන්න" වැනි ප්‍රකාශ වලින් තවදුරටත් එවැනි ස්ථාන වල සිට සේවය කිරීම අධෛර්ය කරයි. පැය 24,32 වැනි කාලපරාස වල ආයතනය අවශ්‍ය වේලා වලදී සේවය කර ඇත. ඉල්ලුම්කරු සහ තත්ත්ව පාලන නිළධාරියෙකු පමණක් නිළධාරීන් ලෙස සිටි ආයතනයේ " අපි විගණන කටයුතු කළා, පැය12 පැය 24ත් අපි වැඩ කළා, අවසානයේ මගේ ප්‍රශ්නයට නිවැරදි පිළිතුරක් ලබා දෙන්න බැරි නම් තවත් එම ආයතනයේ රැඳීලා සිටීම ඵලක් නොවන බව හරස් ප්‍රශ්න වලදී පිළිතුරු දී ඇත.

වග උත්තරකාර පාර්ශ්වයේ අසන්ති කාංචනා දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කරමින් 2022.05.25 දින ඊට අදාල හරස් ප්‍රශ්න වලට පිළිතුරු දී ඇත. එහිදී ඉල්ලුම්කරු තම සාක්ෂියේදී කරන ලද ප්‍රකාශ අසත්‍ය බවට යෝජනා කර තිබේදැයි ඇසූ ප්‍රශ්නයට "නැත" කියා පිළිතුරු දී ඇත. "මානව සම්පත් කළමණාකරණ ක්‍රමවේදය අනුව මුල් පත්වීමට පසුව දෙන උසස්වීමකදී සේවා කොන්දේසි, වැටුප් ක්‍රම, අයිතිවාසිකම් හා වරප්‍රසාද ඇතුළත් විධිමත් පත්වීම් ලිපියක් නිකුත් කරන බව දන්නවාද", "මම දන්න විධියට මෙම ආයතනයේ කෙනෙක් උසස් වීමක් ලැබෙන කොට එම ලේඛනයක් දීමට අවශ්‍ය නැහැ" කියා පිළිතුරු දී ඇත. A1, A2, A3 යන වැටුප් ලේඛන පෙන්වා උසස් වීම් දුන්පසු ඔහුට වැටුප විශාල ප්‍රමාණයකින් අඩු වීමක් තිබෙන බව සාක්ෂිකාරිය පිළිගෙන ඇත. ශ්‍රී ලංකාවේ ආයතනයක වැඩ කරන සේවකයෙකුට උසස් වීම් දුන් විට වැටුප, වරප්‍රසාද වැඩි වෙන්න ඕන බව පිළිගෙන ඇත. සාක්ෂිකාරියට A6 අනුව නෝමල් ඕ.ටී. ගෙවා තිබෙන බවට 2013 අගෝස්තු මස වැටුප් පත්‍රිකාව පෙන්වා ප්‍රශ්න කළ විට රුපියල් 5400.27ක් ගෙවා ඇති බව පිළිගෙන ඇත.

මෙම නඩුවේ ඉදිරිපත් කළ ලිඛිත හා වාචික සාක්ෂිත් ඉල්ලුම්කරු සහ වග උත්තර පාර්ශ්වයේ සාක්ෂිකාරිය දෙන ලද සාක්ෂි සහ හරස් ප්‍රශ්න ඇසීමේදී දෙන ලද පිළිතුරුත්, මුල් හා දෙවන ප්‍රකාශයනුත්, ඉදිරිපත් වී ඇති විරෝධතාත් පරිශීලනය කර විශ්ලේෂණාත්මකව බැලීමේදී උසස් වීම් දීමේදී ඉන්දීය ඇප් ක්‍රමයක් යොදා ගත් බව පෙනීයන නිසාත් එය ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තර කම්කරු නීතීන්ට පටහැනි ආකාරයට යොදා ගෙන තිබ්බ නිසා ඉල්ලුම්කරුට සේවය අතහැර යාමට සිදු වී ඇති බව පෙනේ. එසේ සේවය අතහැර යෑමට සිදු වූ නිසා බාහිර දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු වී ඇති බවද පෙනී යයි. මොහු විසින් ඉදිරිපත් කරන ලද A4 ලේඛනයට අනුව ඔහුට සිදුව ඇති මූල්‍යමය අලාභය සහ ඊට අදාල අධිභාරය ගණනය කිරීමේදී (ලක්ෂ 11) ලක්ෂ එකොළහකට අධික අලාභයක් සිදුව ඇති බව 2021 මාර්තු 13 දින ඉදිරිපත් කළ දිවුරුම් ප්‍රකාශය මත සාක්ෂි දී ඇත.

ඉහත සඳහන් තත්ත්වයන් තුළ සියලු කරුණු සලකා බලා ඔහුගේ සේවා කාලය වන 2012 පෙබරවාරි සිට 2017 සැප්තැම්බර් 20 දක්වා අඩුවෙන් ගෙවල ලද වැටුප්, එම මුදලට අධිභාර මුදල්, කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කර නඩුවක් පවත්වා ගැනීමට ගිය වියදම්, සිත් වේදනා සියල්ල සලකා රුපියල් එකොළොස්ලක්ෂයක මුදලක් නැගෙනහිර කොළඹ කම්කරු කාර්යාලයේ සහකාර කොමසාරිස් නමින් *ගැසට්* ගත කිරීමෙන් මසක් ඇතුළත තැන්පත් කරන මෙන් නියෝග කරමි. එම තීරණය/නියෝගය සධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බවට සහතික කරමි.

ආර්.එස්.ආරියප්පෙරුම,
බේරුම්කරු,

2023 ජනවාරි මස 04 වැනි දින දීය.

EOG 05-0080

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.